# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2013

| පාලි භාෂාව | 3 වසර | කාලය පැය 3 යි |
|---|---|---|

* 1, 2, 3 ප්‍රශ්න ඇතුළු ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

(1) i. පාලි නිඝණ්ඩුව කාගේ කෘතියක් ද ?

ii. මෙම කෘතිය රචනා කළේ කවර යුගයක ද?

iii. ධාතු මඤ්ජුසාව කවර ව්‍යාකරණ සම්ප්‍රදායකට අයත් කෘතියක් ද?

iv. පාලි ධම්ම පදයට අයත් වග්ග ගණන කීය ද?

v. හ්‍රස්ව ස්වර හා දීර්ඝ ස්වර වෙන වෙන ම ලියා දක්වන්න..

vi. ''වාපරෝ අසරූපා" යන බාලාවතාර සූත්‍රයෙන් කෙරෙන කාර්යය කුමක් ද ?

vii. සන්ධි කාර්ය කීයද? ඒ මොනවා ද ?

viii. සමාස නම් කරන්න.

ix. තද්ධිතයේ ප්‍රභේද දෙකකට නිදසුන් දෙන්න.

x. පාලියේ ස්වර 10ක් ගැන කියවෙන්නේ කවර ව්‍යාකරණ සම්ප්‍රදායක ද ?

(ලකුණු 4×10=40)

(2) සිංහලට නගන්න.

අඤ්ඤතරස්මිං කිර ගාමේ ඒකෝ ථේරෝ ච දහර භික්ඛූ ච පිණ්ඩාය චරන්ති. තේ පඨමඝරේ ඒව උළුඞක මත්තං උණ්හයාගුං ලභිංසු. ථේරස්ස ච කුච්ඡිවාතෝ රුජති. සෝ චින්තේසි. අයං යාගු මය්හං සප්පායා යාව න සීතලා හෝති තාව න පිවාමීති. සෝ මනුස්සේහි උම්මාරත්ථාය ආහටේ දාරුකණ්ඩේ නිසීදිත්වා පිවි. ඉතරෝ තං ජිගුච්ඡන්තෝ අති බුද්ධාභිභූතෝ. මහල්ලකෝ අම්හාකං ලජ්ජිතබ්බකං අකාසීති ආහ.ථේරෝ ගාමේ චරිත්වා විහාරං ගන්ත්වා දහර භික්ඛුං ආහ. (ලකුණු 10)

(3) සම්පූර්ණ කරන්න .

| | |
|---|---|
| කුම්භූපමං කායමිමං විදිත්වා ....... | සහස්සම්පිචේ ගාථා ...... |
| අප්පමාද රතෝ භික්ඛූ ..... | ඵන්දනං චපලං චිත්තං ....... |
| සිද සිංගාර පාකේසු ......... | සන්නු පස්සවනාදීසු ......... |

(ලකුණු 5×6=30)

(4) සිංහලට පරිවර්තනය කරන්න.

i. බෝධිසත්තෝ පඨමං බෝධිපල්ලංකං සත්තාහං වීතිනාමේසි.

ii. ඒකස්ස කුමාරස්ස පිතා රෝගේන පීලිතෝ න චිරේනේව කාලමකාසි.

iii. ද්වේ මේ භික්ඛවේ අන්තා පබ්බජිතේන න සේවිතබ්බා.

iv. භගවා පුරේභත්තං පත්තචීවරමාදාය පිණ්ඩාය පාවිසි.

v. සප්පුරිසෝ යාවජීවං පණ්ඩිතමේව පයිරුපාසති. (ලකුණු 2×5=10)

(5) i. ඉකාරාන්ත පුරුෂ ලිංග මුනි ශබ්දය හෝ ඉකාරාන්ත ස්ත්‍රී ලිංග යුවති ශබ්දය සියලු විභක්තිවල වරනගන්න.

ii. හස ධාතුව අජ්ජතනි ආඛ්‍යාත පරස්ස පදයේ වරනගන්න. (ලකුණු 5 ×2=10)

(6) i. සමාස යනු මොනවා ද ?

ii. පාලියේ සමාස කීය ද ?

iii. තප්පුරිස සමාසයේ සියලු ප්‍රභේද සඳහා නිදසුන් සපයන්න. (ලකුණු 1+,3,+6=10)

(7) ඔබ කැමැති කථා වස්තුවක් රසවාහිනියෙන් උපුටා දක්වා එහි එන ධර්මෝපදේශ පිළිබඳ ඇගයීමක් කරන්න. (ලකුණු 10)

(8) 'බෞද්ධයාගේ අත් පොත වශයෙන් පාලි ධම්ම පදයට හිමි වන තැන' පිළිබඳ ඔබේ අදහස් දක්වන්න. (ලකුණු 10)

The National e-learning Portal for The General Education